මගේ අංකය : **5/4/1/09/2023 (09)**
ආයතනික විභාග සංවිධාන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

**2024.08.06**

අහදියියා දහම් පාසල් / අරාබි විදුහල් විදුහල්පති වෙත,

ඉස්ලාම් දීනියාත් (ධර්මාචාර්ය) සහතික පත්‍ර විභාගය - 2024
අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්
-------------------------------------------------------------------------------

**2024 අගෝස්තු මස 09** වන දින රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමට නියමිත උක්ත විභාගයට අදාළ නිවේදනය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවන අතර, අයදුම්පත් සම්පූර්ණ කිරීමේදී පහත සඳහන් උපදෙස් අනුගමනය කරන මෙන් කාරුණිකව දන්වමි.

02. උක්ත විභාගයට අදාළ අයදුම්පත් මේ සමග අමුණා එවන අතර, අයදුම්පත් පිටපත් දෙකකින් සම්පූර්ණ කර , මුල් පිටපත **"විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ"** යන ලිපිනය සඳහන් මේ සමඟ එවා ඇති කවරය තුළ බහා **2024 සැප්තැම්බර් මස 09** වන දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. දෙවන පිටපත අහදියියා දහම් පාසලේ / අරාබි විදුහලේ ගොනුවේ සුරකිව තබා ගත යුතුය. ප්‍රමාදව හා අසම්පූර්ණව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන බැවින් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් එවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

03. ඔබ අහදියියා දහම් පාසලෙන් / අරාබි විදුහලෙන් සත්‍ය වශයෙන්ම ඉදිරිපත් වන අයදුම්කරුවන්ගේ නම පමණක් සඳහන් කිරීමට කටයුතු කරන ලෙසත්, අයදුම්පත සම්පූර්ණ කරන විට අයදුම්කරුවන්ගේ සම්පූර්ණ නම හා අනෙකුත් විස්තර නිවැරදිව ඇතුළත් කර ඇති බව හොඳින් සනාථ කර ගත් පසුව අයදුම්පතේ තම අත්සන යෙදිය යුතු බවට අයදුම්කරුවන් වෙත උපදෙස් දීමට කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වමි. අයදුම්පතේ සඳහන් ඔබේ අහදියියා දහම් පාසලට / අරාබි විදුහලට ලබා දී ඇති අංක 06කින් යුතු පරිගණක අංකය (SCHOOL NO.) නිවැරදි බව සනාථ කර ගන්න.

04. ප්‍රථම වතාවට මෙම විභාගය සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවෙන් නිදහස්ය. දෙවන වතාවට හෝ ඊට වැඩිවන වතාවකට හෝ පෙනී සිටින අයදුම්කරුවන් සහ සියලුම බාහිර අයදුම්කරුවන් රු. 200/-ක විභාග ගාස්තුවක් ගෙවිය යුතු අතර ඌන සාමර්ථ්‍ය විෂයයක් සඳහා රු. 50/-ක විභාග ගාස්තුවක් ගෙවිය යුතුය. විභාග ගාස්තු ගෙවිය යුතු වන අයදුම්කරුවන් සියලු දෙනාගෙන්ම අයවිය යුතු මුළු මුදල එකතු කර විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක 20-03-02-13ට බැරවන සේ දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකට පමණක් ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතෙහි දෙවන පිටුවේ ඇලවිය යුතුය. ලදුපතෙහි ඡායා පිටපතක් ලබා ගෙන අහදියියා දහම් පාසලේ / අරාබි විදුහලේ ගොනුවේ සුරකිව තබා ගන්න.

05. බාහිර අයදුම්කරුවන්ට පෞද්ගලිකව විභාගයට ඉල්ලුම් කිරීමට අවස්ථාව දෙනු නොලැබේ. තම පදිංචි ස්ථානයට ආසන්නම අහදියියා දහම් පාසල / අරාබි විදුහල මඟින් අයදුම් කරන ලෙස ඔවුනට උපදෙස් දී ඇත. එබැවින් ඔබ ප්‍රදේශයේ යම් බාහිර අයදුම්කරුවකු පැමිණ මෙම විභාගයට ඉදිරිපත් වීමට අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලා සිටියහොත් ඔහුගේ / ඇයගේ සුදුසුකම් **2024 අගෝස්තු මස 09** වන දින පළවන ගැසට් නිවේදනයේ සඳහන් පරිදි සපුරා ඇති බව සනාථ කර ගෙන විභාග ගාස්තු අයකොට ඔබගේ අහදියියා දහම් පාසල / අරාබි විදුහල මඟින් ඉල්ලුම් කිරීමට අවස්ථාව ලබා දෙන ලෙස විශේෂයෙන් ඉල්ලා සිටිමි.

06. විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවකු ඔබ අහදියියා දහම් පාසල / අරාබි විදුහල හරහා අයදුම්පත් ඉදිරිපත් කරන්නේ නම් ඔහුගේ / ඇයගේ විශේෂ අවශ්‍යතාවේ ස්වභාවය ලිඛිතව දැන්වීමට කටයුතු කර, ඊට අදාළ වෛද්‍ය වාර්තා අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය.

සටහන : විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකුම මෙම විභාගයට අදාළ අවම සුදුසුකම් සපුරා ඇති බවට අයදුම්පත් සහතික කරන අහදියියා දහම් පාසලේ / අරාබි විදුහලේ විදුහල්පතිවරයා වගකිව යුතුය.

ජේ.ඒ.ජේ.ආර්. ජයකොඩි
නියෝජ්‍ය විභාග කොමසාරිස් (සංවිධාන)
විභාග කොමසාරිස් ජනරාල් වෙනුවට